## නීති ආධාර කොමිසම - 2013

නීති ආධාර කොමිසමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 27 දරන නීති ආධාර කොමිසම පනතේ 23(3) වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්, විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිසමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිසමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නීති ආධාර කොමිසමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු. 233,500 ක් වූ කාර්යාල උපකරණ සාවද්‍ය ලෙස ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකරන ලද රු. 165,823 ක් වටිනා චෙක්පත් 40 ක් ණයහිමි ගිණුමට බැර කරනවා වෙනුවට වියදම් ගිණුමට බැර කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ඌණතාව එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී බැංකු දෙකක් හරහා කරන ලද රු. 3,678,488 ක ගනුදෙනු ගිණුම්ගත කර නොතිබුණු අතර ශේෂ පත්‍ර දිනට ඉතිරි ශේෂය රු. 1,725,418 ක් විය.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 192,341 ක් වූ ගෙවීම් වවුචර් 14 ක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2.2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තොර ගනුදෙනු**

(අ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 31/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වර්ෂයකට රු.5000 ක උත්සව අත්තිකාරමක් නිලධාරීයෙකුට ගෙවිය හැකිය. කෙසේ වෙතත් එකී චක්‍රලේඛයට පටහැනිව කොමිසම විසින් එක් එක් සේවකයෙකුට රු. 12,000 බැගින් එකතුව රු. 1,944,000 ක් ගෙවා තිබුණි. තවද, 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක පීඑෆ්/පීඊ/5 පරිදි මේ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) දෙයියන්දර නීති ආධාර මධ්‍යස්ථානය කුළියට ගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලැබේ. මධ්‍යස්ථානයකට දොරක් සවිකිරීම සඳහා රු. 68,750 අනුමත කර තිබූ නමුත් එම කාර්යය සඳහා රු.81,600 ක් ගෙවා තිබුණි. එම මුදල ගොඩනැගිලි කුළියෙන් අයකර ගෙන නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (I) මුදල් රෙගුලාසි 138(6), 139(1), 264 | 2013 ජනවාරි සහ පෙබරවාරි කාල පරිච්ඡේදය තුළදී කරන ලද එකතුව රු.205,448 ක වියදම්වලට අදාල ගෙවීම් වවුචර් 20 ක් සඳහා ඉන්වොයිසි, ලදුපත් යන ආධාරක ලියකිවිලි අමුණා නොතිබුණි. |
| (II) මුදල් රෙගුලාසි 168, 169 | මුදල්, චෙක්පත් මුදල් ඇණවුම් ආදී ලැබීම් සඳහා නිල ලදුපත් නිකුත් කළ යුතු නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී ලද රු. 14,514,470 ක් වටිනා මුදල් සහ චෙක්පත් සඳහා කොමිෂන් සභාව විසින් ලදුපත් නිකුත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,222,372 ක ඌණතාවයක් අතර ඊට අනුරූපව ඉකුත් වසරේ මූල්‍ය ප්‍රතිඵලය රු. 18,536,369 ක ඌණතාවයක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,313,997 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ආදායම් රු.21,542,923 කින් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබීය.

(අ) උසාවි නඩු 36, 486 කින් සමාලෝචිත වර්ෂය තුළදී නඩු 4,932 ක් පමණක් නිමකර තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට නොවිසඳා තිබු නඩු සංඛ්‍යාව 31,554 ක් විය.

(ආ) ප්‍රධාන කාර්යාලය සහ වෙනත් මධ්‍යස්ථාන 74 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලයන් 54, 132 කට නීති උපදෙස් ලබාදී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී නව නීති, ආධාර මධ්‍යස්ථාන 2 ක් ස්ථාපනය කොට තිබුණි.

**4.2 මානව සම්පත් කළමනාකරණය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඇ) වගන්තිය පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මෙම වාර්තාවේ දිනය දක්වා අනුමත කරගෙන නොතිබුණි. තථ්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය** | **2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය** |
|---|---|---|
| මාණ්ඩලික | 127 | 99 |
| මාණ්ඩලික නොවන | 38 | 77 |
| වෙනත් | 45 | 39 |
| එකතුව | 210 | 215 |

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිසන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

(අ) ගෙවීම්
(ආ) ලැබීම්
(ඇ) බැංකු ගිණුම්
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) උත්සව අත්තිකාරම් ගෙවීම්